සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**Provincial Department of Education - NWP**

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

**දෙවන වාර පරීක්ෂණය - 2025**
**Second Term Test - 2025**

**7 ශ්‍රේණිය** | **බුද්ධ ධර්මය** | **කාලය පැය 02 යි**

නම/ විභාග අංකය:

සැලකිය යුතුයි

- පළමු කොටසේ සියලු ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- දෙවන කොටසේ පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

---

## I - කොටස

- ප්‍රශ්න අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතරින් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. බුදු රදුන් සත් සතිය ගත කළ ආකාරය දැක්වෙන පාඨය වන්නේ,
    (1) අග්ගෝ හමස්මි ලෝකස්ස
    (2) නිධීනංච පවත්තාරං
    (3) පඨමං බෝධි පල්ලංකං
    (4) දානං සීලංච නෙක්ඛම්ම

02. සමාපත්ති සුවයෙන් බුදු රදුන් වැඩ සිටියේ,
    (1) පස්වන සතියේ ය.
    (2) සත්වන සතියේ ය.
    (3) සිව්වන සතියේ ය.
    (4) දෙවන සතියේ ය.

03. කෝලිත හා උපතිස්සගේ ගුරුවරයා වූ සංජය,
    (1) බ්‍රාහ්මණයෙකි.
    (2) පිරිවැජියෙකි.
    (3) ජටිලයෙකි.
    (4) තවුසෙකි.

04. ගිලනුන්ට උපස්ථාන කරන්නකු තුළ තිබිය යුතු ගුණාංග,
    (1) 5 කි.
    (2) 6 කි.
    (3) 7 කි.
    (4) 8 කි.

05. සියලු කෙලෙස් නසා තුන්ලොව පිළිබඳ ව මනාකොට දැනගෙන නොදන්නා වූ ලොක ප්‍රජාවට ඉතා පැහැදිලි ලෙස දේශනා කළ බැවින් බුදු රදුන්,
    (1) අරහං වේ.
    (2) ලෝකවිදූ වේ.
    (3) සුගත වේ.
    (4) සම්මා සම්බුද්ධ වේ.

- **අංක 06 සිට 10 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියන්න.**

(සුදත්ත / කරණීය මෙත්ත / විශාඛා / තුන් සූත්‍රය / සුමනා / ධනංජය)

06. මහා මංගල, රතන, කරණීය මෙත්ත යන සූත්‍රවලට ........................................................ යැයි කියනු ලැබේ.

07. මෛත්‍රීය වැඩිය යුතු ආකාරය දැක්වෙන්නේ ........................................................................ සූත්‍රයේ ය.

08. සැවැත් නුවර සුමන සිටුවරයාගේ පුතණුවන් ..................................................................... සිටුතුමා ය.

09. ......................................... දියණිය වැස්සේ තෙමි තෙමී සුපුරුදු ගමනින් අසල තිබූ ශාලාවකට පැමිණියා ය.

10. අනේපිඬු සිටුතුමාගේ දියණිය ......................................................................................................... නම් විය.

- **අංක 11 සිට 15 තෙක් ප්‍රශ්නවලට (අ) තීරුවට ගැලපෙන පිළිතුර (ආ) තීරුවෙන් තෝරා එහි ඉංග්‍රීසි අක්ෂරය වරහන තුළ ලියන්න.**

| | (අ) | | | (ආ) |
|---|---|---|---|---|
| 11. | සෝවාන් වූ පළමු රජතුමා | ( ) | (a) | හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි |
| 12. | සීල, සමාධි, ප්‍රඥා | ( ) | (b) | බිම්බිසාර රජු |
| 13. | ජාතියට නායකත්වය ලබාදුන්නේ | ( ) | (c) | අපණ්ණක ජාතකය |
| 14. | ධම්ම සේනාධිපති | ( ) | (d) | ත්‍රිශික්ෂා |
| 15. | ඥානවන්තව කටයුතු කිරීම නිසා සමෘද්ධියට පත් වෙළෙඳ කණ්ඩායම | ( ) | (e) | සැරියුත් හිමි |

- **ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවල දැක්වෙන ප්‍රකාශ හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (✗) ලකුණ ද ඉදිරියේ ඇති වරහනෙහි යොදන්න.**

16. ගිම්හානය යනු වැසි නොවැටෙන වියළි සමයයි. ( )

17. සූත්‍ර පිටකයේ ඛුද්දක නිකායට අයත් ග්‍රන්ථ ගණන 20 කි. ( )

18. බුදු රදුන්ට කිරිපිඬු පූජාව පිළිගැන්වූයේ සුජාතා සිටු දියණියයි. ( )

19. පොහොය දින සමාදන් විය යුත්තේ අටසිල් ය. ( )

20. සදිසා නමස්කාරයට අනුව ගුරු සිසු යුතුකම් දැක්වෙන්නේ බටහිර දිශාවෙනි. ( )

(ලකුණු 2 x 20 = 40)

## II කොටස

- **පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.**

01 කෙටි පිළිතුරු සපයන්න.

(i) යහපත් කොට යෙතැයි - සුන්දර තැනට සැපතැයි....

ඉතිරි දෙපදය සම්පූර්ණ කරන්න.

(ii) බුදුන් හා දහම් සරණ ගිය පළමු (ද්වේවාචික) උපාසකවරු කවුරුන් ද?

(iii) සත්‍ය සොයා යන අවධියේ සිදුහත් බෝසතුන්ට හමු වූ ගුරුවරුන් දෙදෙනා නම් කරන්න.

(iv) නව අරහාදී බුදු ගුණ ඇසුරින් බුදුගුණ අලංකාරය රචනාකරන ලද්දේ කවුරුන් විසින් ද?

(v) බුදු සසුනේ අග්‍ර දායකයා හා අග්‍ර දායිකාව කවුරුන් ද?

(vi) බුදු රදුන් විසින් අනුමත දැහැමි රැකියා 2 ක් ලියන්න.

(vii) හෙළ බොදු සිරිතට අනුව ''අක්කියාල'' වෙන් කිරීම යන්නෙහි තේරුම ලියන්න.

(viii) අඥාන වෙළෙඳ නායකයෙකුගේ ක්‍රියා කලාපය හා ඥානවන්තව කටයුතු කිරීමෙන් සමෘද්ධියට පත් වෙළෙඳ කණ්ඩායම පිළිබඳ කියවෙන ජාතක කතාව කුමක් ද?

(ix) පංචශීලයෙහි ඇති අංශ 2 නම් කරන්න.

(x) මෛත්‍රිය වැඩිය යුතු ආකාරය මැනවින් දේශිත සූත්‍රය කුමක් ද? (ලකුණු $2 \times 10 = 20$)

02. (i) අක්කොච්ජිමං අවදිමං...... යන ගාථාව සම්පූර්ණ කරන්න.

(ii) එහි තේරුම සරල බසින් ලියන්න.

(iii) ධම්ම පදයෙන් ලබාගත හැකි ආදර්ශ 5 ක් ලියන්න. (ලකුණු $2 + 3 + 5 = 10$)

03. (i) පංචශීලය යන්න හැඳින්වීමට යොදන තවත් නම් 2 ක් ලියන්න.

(ii) පංචශීලය පිළිවෙළින් ලියන්න.

(iii) පංචශීලයෙහි සාමාජික අගය දැක්වෙන වැකි 5 ක් ලියන්න. (ලකුණු $2 + 3 + 5 = 10$)

04. (i) සදිසා නමස්කාරය ඇතුළත් සූත්‍ර දේශනාව කුමක් ද?

(ii) ගුරු සිත නොරිදවා..... යන කාව්‍යශේඛරයට අයත් කවිය සම්පූර්ණ කරන්න.

(iii) ගුරු සිසු යුතුකම් හා වගකීම්වලින් 5 ක් ලියන්න. (ලකුණු $2 + 3 + 5 = 10$)

05. (i) විශාඛා උපාසිකාව හා අනේපිඬු සිටුතුමා සාදවන ලද ආරාම දෙකෙහි නම් ලියන්න.

(ii) කුලගෙට යන විශාඛාවට පියාණන් විසින් ලබාදුන් අවවාද 3 ක් ලියන්න.

(iii) විශාඛාවගේ චරිතයෙන් ගත හැකි ආදර්ශ 5 ක් ලියන්න. (ලකුණු $2 + 3 + 5 = 10$)

06. (i) අලුත් අස්වැන්න ගෙටගැනීමත් සමග නිවසේ සිදුකරන චාරිත්‍ර 2 ක් ලියන්න.

(ii) අග්‍රශෂ්‍ය දානය පිලිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.

(iii) මිහිඳු හිමිගේ ආගමනය සමග කෘෂි චාරිත්‍ර හැරුණුකොට අපට ලැබුණු ගුණ ධර්ම 5 ක් ලියන්න.

(ලකුණු $2 + 3 + 5 = 10$)

07. මාතෘකා 2 ක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න.

(i) සත්සතිය

(ii) අනේපිඬු සිටුතුමා

(iii) මෛත්‍රී භාවනාව

(iv) සිරිත් විරිත් (ලකුණු 10)

## පිළිතුරු පත්‍රය - I කොටස

(01) 2 (02) 3 (03) 3 (04) 1 (05) 2 (06) තුන් සූත්‍රය (07) කරණීයමෙත්ත
(08) ධනංජය (09) විශාඛා (10) සුමනා (11) b (12) d (13) a
(14) e (15) c (16) ✓ (17) × (18) ✓ (19) ✓ (20) ×

(ල. 2 x 20 = 40)

## II - කොටස

01. (i) සොඳුරු බස් කියතැයි - කියති ඒ මුණි රජුට සුගතැයි
(ii) තපස්සු - භල්ලුක වෙළෙඳ දෙබෑයන්
(iii) අලාර කාලාම - උද්දකරාමපුත්ත
(iv) වීදාගම මෛත්‍රී හිමියන්
(v) අනේපිඬු සිටුතුමා හා විශාඛා සිටු දියණිය
(vi) කෘෂි කර්මාන්තය / සත්ත්ව පාලනය / රාජ්‍ය සේවය / වෙළෙඳාම / වෙනත් ශිල්ප
(vii) දෙවියන් පුදන කොටස
(viii) අපණ්ණක ජාතක කතාව
(ix) සමාදානය හා වීරමණය
(x) කරණීයමෙත්ත සූත්‍රය (ල. $10 \times 2 = 20$)

02. (i) අක්කොච්ජිමං අවධිමං / අජිනිමං අහාසි මේ / යේතං උපනයිහන්ති / වේරං තේසන්ත සම්මති
(ii) අසවලා මට බැන්නේ ය. මට පහර දුන්නේ ය. මා පරාජය කළේ ය. මා සතු දෙය පැහැර ගත්තේ ය යනුවෙන් යම් අය නැවත නැවත සිතත් නම් ඔවුන්ගේ වෛරය නොසන්සිඳේ.
(iii) කිසිවෙක් කිසිවෙකුට වෛර නොකළ යුතුය. / පව් නොකළ යුතුය. / වෙහෙස මහන්සියෙන් වැඩ කළ යුතුය. / අයහපත් ක්‍රියා නොකළ යුතුය. / යහපත් ක්‍රියාවලම යෙදිය යුතුය. / සතුන්ට හිරිහැර නොකළ යුතුය ආදී වූ පිළිතුරු ලියා ඇත්නම් ලකුණු ලබාදෙන්න. (ල. $2+3+5=10$)

03. (i) ගේහසිබ ශීලය / නිත්‍ය ශීලය
(ii) පංච ශීලය පිළිවෙළින් ලියා ඇත්නම් ලකුණු ලබාදෙන්න.
(iii) 08 පාඩම (60 - 64 දක්වා පිටු) දරුවා ලියා ඇති පිළිතුර බලා ලකුණු දෙන්න. (ල. $2+3+5=10$)

04. (i) සිඟාලෝවාද සූත්‍රය
(ii) ගුරු සිත නොරිදවා - වේලාව නොවරදවා
බැති පෙම් උපදවා - අකුරු උගනී කුමරු සොඳවා
(iii) 10 පාඩම (72 - 77 දක්වා පිටු) (ල. $2+3+5=10$)

05. (i) පූර්වාරාමය / ජේතවනාරාමය
(ii) ඇතුළත ගිනි පිටතට නොදිය යුතුය. / පිටත ගිනි ඇතුළට නොගත යුතුය. / දෙන්නන් හට දිය යුතුය. / නොදෙන්නන් හට නොදිය යුතුය. / දෙන්නන් හටත් නොදෙන්නන්හටත් දිය යුතුය.
(iii) ගැහැනු ළමයෙකුට ගැලපෙන ඉරියව් පවත්වාගෙන යාම. / දියණියක ලෙස දෙමාපිය උපදෙස් නිසි පරිදි පිළිපැදීම. / ධන බලයෙන් හා රූමත්කමින් උඩඟු නොවීම. / ආගම දහමට ලැදිව කටයුතු කිරීම. / අලස නොවී කඩිසරව කටයුතු කිරීම. (ල. $2+3+5=10$)

06. (i) අලුත් සහලින් දානය සකස් කර පන්සලට හා බුද්ධ පූජාව සහ සඟරුවනට දන් පිළිගැන්වීම.
(ii) අග්‍රශෂ්‍ය දානය

අග්‍රශෂ්‍ය දානය යනු අලුත් බත් දානයයි. කුඹුරුවලින් අස්වනු ලබාගැනීමෙන් අනතුරුව එහි පළමු කොටස ත්‍රිවිධ රත්නයට පූජා කිරීමයි. මෙහිදී දානය පිළියෙල කිරීමේ සිට පූජාව තබනතුරු කිසිවෙකු වී ඇටයක්වත් ඉඳුල් කරනු නොලැබේ.

(iii) පරෝපකාරය / ආගන්තුක සත්කාරය / දානය / වැඩිහිටියන්ට සැලකීම / අසරණයන්ට පිහිටවීම (ආදී වූ ගුණ ලියා ඇත්නම් ලකුණු දෙන්න.) (ල. $2+3+5=10$)

07. අදාළ මාතෘකාවලට ප්‍රමාණවත් ලෙස පිළිතුරු ගොනුකර ඇත්නම් ලකුණු ලබාදෙන්න. (ල. $5+5=10$)